**වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය**

**ලලිත් ඇතුලත් මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල**

# තනතුරු පුරප්පාඩු

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි අධ්‍යක්ෂ තනතුර සඳහා තිසි සුදුසුකම් සපුරන ලද ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් පදනම මත)

**1. අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද**

බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1.1 හෝ 1.2)

1.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය, වාණිජ, ගිණුම්කරණය හෝ ව්‍යාපාර පරිපාලනය සහ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

**සමඟ**

අදාල ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම/ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම ලබාගැනීමෙන් පසුව රජයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරුවල අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්දක් ලබාතිබීම.

1.2 තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක " කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

**2. වැටුප් හා දීමනා :**

තෝරාගනු ලබන අයදුම්කරුගේ සුදුසුකම් මත භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

**3. වයස :**

වයස අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතු අතර, අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**4. වෙනත් කරුණු;**

4.1 සෑම අයදුම්කරුවෙකුම, ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය. තනතුරෙහි රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසු ශාරීරික සහ මානසික සෞඛ්‍යයෙන් යුක්ත අයෙකු විය යුතු අතර, දිවයිනෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි විය යුතුය. විශිෂ්ට චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය. ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂා පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

4.2 සේවකයාගේ වැටුප පදනම් කොටගෙන සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක දායකත්වයක් ද, සේවකයාගෙන් 10% ක දායකත්වයක් ද සමඟ ආයතනය විසින් සේවකයා වෙනුවෙන් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට 3% ක් ද බැර කිරීමක් කරනු ලැබේ.

4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදුකරනු ලැබේ.

44 අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, උපන් දිනය, වයස, ජාතිකත්වය, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් සඳහන් කළයුතු තොරතුරු ද, ඇතුලත්ව ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක සහ ලිපින සහිත අයදුම්පත් අදාල සහතික වල ඡායා පිටපත් ද සමඟ ලේකම්, වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය, අංක 492, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03 ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2024 අගෝස්තු 16 දින හෝ එදිනට පෙර එවිය යුතුය.

4.5 අයදුම්පත බහාලන ලද ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි **"මහපොළ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ තනතුර සඳහා වන අයදුම්පත"** ලෙස සඳහන් කළ යුතුය.

4.6 අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත්‍ර භාරගනු නොලැබේ.

**ලේකම්,**
**වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය,**
**අංක 492, ආර්. ඒ. ද මෙල් මාවත,**
**කොළඹ 03.**